# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

සුරාබදු නියාමක / සුරාබදු නියාමිකා තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2023 වර්ෂය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක / නියාමිකා තනතුරු සඳහා පහත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. විභාග අයදුම්පතේ පිටපතක් අයදුම්කරු විසින් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ බලධාරීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

විභාගය දිවයින පුරා පිහිටි ප්‍රධාන නගරවලදී පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වේ.(නගර හා නගර අංක ඇතුළත් ලේඛනය මෙම නිවේදනය අවසානයේ උපලේඛන අංක 01 ලෙස ඇතුළත්ය.) අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් කළ යුතු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරනු ලබන නගරය/නගර උපලේඛන අංක 01 ට අනුව විය යුතු අතර ඉල්ලුම් කරන ලද නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරය හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය .-

සුරාබදු නියාමක / නියාමිකා පුරප්පාඩු ගණන :-100
එයින් 10%ක් කාන්තා අයදුම්කරුවන් වෙනුවෙන් වෙන් කෙරේ.

මූලික සුදුසුකම්ලත් අය තරග විභාගයකට සහ ඉන් සමත් වන අය සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට ලකුණු දීමෙන් අනතුරුව බඳවා ගනු ලැබේ.

සීමිත පදනම යටතේ පිරවීමට නියමිත තනතුරු ප්‍රමාණය ඒ යටතේ පිරවීමට නොහැකි වුවහොත් එම තනතුරු ද විවෘත පදනම යටතේ තෝරා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ.

ලිඛිත විභාගය හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර, ලිඛිත විභාගය සමත්වන අය අතුරින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබන ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළින් බඳවා ගනු ලැබේ. එම අය සම්බන්ධයෙන් රහස්‍ය වාර්තා සහ ඔවුන්ට විරුද්ධව සුරා අපරාධ හා වෙනත් අපරාධ නොමැති බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව තෝරා ගනු ලබන්නන් මාස හය (06) ක පුහුණුව සඳහා බඳවා ගනු ලබන අතර, ඉන් මාස 03 ක් පුහුණු පාසලේ සහ ඉතිරි මාස තුන (03) ක්ෂේත්‍ර පුහුණුවක් වේ. එම පුහුණුව සාර්ථකව නිම කරනු ලබන්නන් සුරාබදු නියාමක තනතුරට බඳවා ගනු ලැබේ.

02. *තනතුරේ සාමාන්‍ය රාජකාරි විස්තරය .-*

පවරනු ලබන බල ප්‍රදේශය තුළ ක්ෂේත්‍ර රාජකාරි කටයුතු කරමින් සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැනෙන සුරාබදු ආඥාපනත සහ අනෙකුත් අණ පනත්, වස විෂ අබිං හා අන්තරායකාරී ඖෂධ හා ආඥා පනත, 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත, 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යන අණ පනත් යටතේ සුරා අපරාධවලට අදාළ තොරතුරු සොයා වාර්තා කිරීම, එවැනි වැටලීම්වලට සහාය වී අදාළ අධිකරණ කටයුතුවලට සහාය ලබාදීම, කාර්යාලයේ උපසේවා රාජකාරී ඇතුළු සුරා අපරාධ/කාර්මික වාර්තා, ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම හා ඉදිරිපත් කිරීම සඳහා සහාය වීම. නිෂ්පාදනාගාර, ස්කාගාර හා ගුදම් රාජකාරිවල නියැලීම.

රා එකතු කිරීම් මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම හා ග්‍රහණ කටයුතුවල යෙදීම.

03. *වැටුප් පරිමාණය .-*

RS-1-2016 රු.29,540-7x300-27x370-41,630/- මාසික වැටුපක් මෙම තනතුරට අයත් වේ. (රා .ප.ච.03/2016 ට අනුව)

04. *වයස් සීමාව .-*

අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනට වයස අවු.18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

"ඒ අනුව 2006.03.22 වැනි දිනට හෝ ඊට පෙර හා 1989.03.22 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත."

උදා:- 2024.03.22 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතු නම්, අයදුම් කළ හැක්කේ 2006.03.22 වැනි දින හෝ ඊට පෙර හා 1989.03.22 වැනි දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණි.

05. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් .-

i. සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයන්ට සම්මාන සාමර්ථ්‍ය සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයන් 6 කින් එක් වරකදී අ.පො.ස.(සා.පෙළ)විභාගයෙන් සමත් වීම.
ii. පිරිමි අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් උස අඩි 5 අඟල් 06ක් තිබිය යුතුය. පපුවේ වට ප්‍රමාණය ආශ්වාස නොකර අඟල් 33 ක් දකාන්තා අයදුම්කාරිනියන් සඳහා උස අඩි 5අඟල් 2ක්විය යුතුය.
iii. උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්ණාඩියක් (කන්ටැක් ලෙන්ස) රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12 වශයෙන් ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය.
iv. අයදුම්කරුවන්/අයදුම්කාරියන් යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
v. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.
vi. ක්‍රීඩා කුසලතා හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ප්‍රමුඛත්වය දෙනු ලැබේ.
vii. සියලුම අයදුම්කරුවන්/අයදුම්කාරියන් අවිවාහක විය යුතුය.

ඉහත සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී තිබිය යුතුය.

06. ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තරː

විභාගය පැවැත්වෙන්නේ සිංහලහා දෙමළ මාධ්‍යවලින් පමණක් වේ. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | පැය 1 | 100 | 40% |

විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පදගත සංඛ්‍යාත්මක හා රූපාකාර සංදර්ශනයන් තුළ ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් හා ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය,තර්කන හැකියාව,විශ්ලේෂණාත්මක හැකියාව හා බුද්ධිය මැනීම. |
| 2. සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ හා ලෝකයේ කාලීන සමාජීය සිදුවීම් තොරතුරු පිළිබඳව සාමාන්‍ය දැනුම මැනබැලීම. |

07. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

i. අතිරේක අධ්‍යාපන සුදුසුකම් ː- ලකුණු 20 (පශ්චාත් උපාධි/උපාධි -ලකුණු 10/ඩිප්ලෝමා - ලකුණු 07 /සහතික පත්‍ර පාඨමාලා -ලකුණු 03 )
ii. ක්‍රීඩා කුසලතා ː-(ලකුණු 09)
iii. බාලදක්ෂ/ශිෂ්‍යභටː- (ලකුණු 09)
iv. ආත්මාරක්ෂක සටන් ක්‍රම ː-(ලකුණු 09)
v. සමාජ සේවා කටයුතුවලට අදාළව දැරූ නිලතලː- (ලකුණු 09)
vi. රියදුරු බලපත්‍රයක් ලබා තිබීම ː (ලකුණු 09)
vii. පරිගණක හැකියාව ː-(ලකුණු 15)
viii. භාෂා හැකියාව ː-(ලකුණු 15)
ix. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවː-(ලකුණු 05)

08. අයදුම්කිරීමේ ක්‍රමය ː

අයදුම්පත් 2024.02.23 දින පෙ.ව.9.00 සිට 2024.03.22 දින මධ්‍යම රාත්‍රී 12.00 තෙක් මාර්ගගතව පමණක් භාරග නු ලැබේ. මාර්ගගත (online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා ලියාපදිංචි මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (verify) සිදු කරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව, එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විභාග ගාස්තු රු.600/-කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Cards)
II. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Cards)
III. ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

**සටහන** :- ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තු සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කිසිදු හේතුවක් මත ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.

09. *පුහුණු කාලය :*

තෝරා ගනු ලබන සෑම අපේක්ෂකයෙක්ම/අපේක්ෂිකාවක්ම පළමුව අභ්‍යාසලාභී සුරාබදු නියාමකයින්/නියාමිකාවන් වශයෙන් පත් කරනු ලබන අතර සුරාබදු නියාමක/සුරාබදු නියාමිකා තනතුරට පත් කිරීම සඳහා අවම වශයෙන් මාස 06ක අභ්‍යාසයක් ලබා ඉන් අනතුරුව නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතුය. ඉන් මාස තුන (03) ක් පුහුණු පාසලේ සහ ඉතිරි මාස තුන (03) ක්ෂේත්‍ර පුහුණුවක් වේ. එම පුහුණුව සාර්ථකව නිම කරනු ලබන්නන් සුරාබදු නියාමක තනතුරට බඳවා ගනු ලැබේ.

සුරාබදු නියාමක පුහුණුව සඳහා ප්‍රාථමික පත්වීම ලැබූ දින සිට අවම වශයෙන් මාස හය (06) ක් වූ පුහුණුවන කාලය සඳහා පුහුණු දීමනාවක් ගෙවනු ලැබේ. (පුහුණු දීමනාව අදාළ බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවන්වල දී තීරණය කෙරෙනු ඇත.)

10. *පරිවාස කාලය :*

සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන අපේක්ෂකයින් තුන් (03) අවුරුදු පරිවාස කාලයකට යටත් කොට සුරාබදු නියාමක /සුරාබදු නියාමිකා තනතුරුවලට පත් කරනු ලැබේ. පරිවාස කාලය අවසානයේ දී අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව පවත්වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වුවහොත් අදාළ තනතුරේ ස්ථිර කරනු ලැබේ.

11. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

ii. දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට නියම කළ හැකිය.

12. *සේවා කොන්දේසි :*

i. රාජ්‍ය භාෂා නීතිය හා රජය විසින් වරින් වර පනවනු ලබන සියලුම නීති රෙගුලාසි අනුව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතුය.

ii. 2310/29 හා 2022.12.14 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්යපරිපාටික රීතිවල කාණ්ඩයේ III -I වැනි පරිච්ඡේදය, VII වැනි පරිච්ඡේදය හා VIII වැනි පරිච්ඡේදය අදාළ වේ.

iii. ශාරීරික සුදුසුකම් අයදුම්කරුවන් කෙරෙහි තිබේ දැයි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර පරීක්ෂා කරනු ලැබේ.

13. තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත්වන හා පත් කරන ලද තනතුරක් හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.

14. *ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්* කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් මාර්ගගතව යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය.එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්,එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

15. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය.

ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් පත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන් ට අයදුම්කරු හඳුනාගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

16. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. සියලුම අයදුම්කරුවන් තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය.

17. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදු වේ.

18. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්. ජේ. ගුණසිරි,
සුරාබදු කොමසාරිස් ජනරාල්.

2024 පෙබරවාරි මස 22 වැනි දින,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව.

අයදුම්පතේ 1 සිට 6 දක්වා ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය සුදුසු පරිදි සෙසු පිටුවලට ද ඇතුළත් කරන්න.

උපලේඛන අංක 01

| දිස්ත්‍රික්කය / නගරය | දිස්ත්‍රික් /නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| යාපනය | 04 |
| මඩකලපුව | 05 |
| කුරුණෑගල | 06 |
| අනුරාධපුරය | 07 |
| බදුල්ල | 08 |
| රත්නපුර | 09 |